දුරකථන ) 2698475
தொலைபேசி ) 2698490
Telephone ) 2698507

ෆැක්ස් ) 2692913
பெக்ஸ் ) 2693869
Fax )

විද්‍යුත් තැපෑල )
மின்னஞ்சல் முகவரி ) postmaster@health.gov.lk
e-mail )

වෙබ් අඩවිය )
இணையத்தளம் ) www.health.gov.lk
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) NCCP/ORAL/GOSL/07/2023
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 8 .07.2023
Date )

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
சுகாதார மற்றும் சுதேச வைத்திய சேவைகள் அமைச்சு
Ministry of Health and Indigenous Medical Services

---

චක්‍රලේඛ ලිපි අංක : 02 – 100 /2023

සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියලුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියලුම ආයතන ප්‍රධානීන්,
සියලුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් වෙත,

**ලෝක හිස සහ ගෙල ආශ්‍රිත පිළිකා දිනය - 27 ජුලි 2023**
**"සායනික මුඛ පරීක්ෂාවෙන් සුවැති මුවක්"**

ශ්‍රී ලංකාවේ පුරුෂයින්හට වැළඳුණු පිළිකා අතරින් ප්‍රමුඛතම පිළිකාව මුඛ පිළිකාව වන අතර (පිරිමින්ට වැළඳුනු සියලුම පිළිකා අතරින් 13% පමණ) ගැහැණුන්හට වැළඳුනු පිළිකා අතරින් එය අටවන ස්ථානය ගනී. වර්ෂයකට අළුතින් මුඛ පිළිකා රෝගීන් 3000 පමණ වාර්තා වන අතර දිනකට මුඛ පිළිකා ආශ්‍රිත මරණ 2-3 පමණ සිදු වේ. මුඛ පිළිකා සඳහා ප්‍රධාන ප්‍රතිකාරය ශල්‍යකර්ම වේ. ශල්‍ය ප්‍රතිකාරවලින් මුහුණේ පෙනුමට හා ක්‍රියාකාරීත්වයට ඇති වන සීමාවීම් එදිනෙදා ක්‍රියාකාරකම් කෙරෙහි අහිතකර බලපෑමක් ඇතිකරයි. ප්‍රතිකාර වල දීර්ඝකාලීන ස්වභාවය නිසා ඒ වෙනුවෙන් අධික වියදමක් දැරීමට රෝගියාට සිදු වේ. මෙම තත්වය හේතු කර ගෙන මුඛ පිළිකාව රෝගියාට මෙන්ම පවුලේ උදවියටත් දැඩි මානසික බලපෑමක් ඇතිකරයි.

මුඛ පිළිකා කලින් හඳුනාගත හැකි පිළිකාවක් ලෙස වර්ග කෙරෙනුයේ බොහෝ මුඛ පිළිකා ඇතිවීමට පෙර මුඛ කුහරය තුළ පූර්ව මුඛ පිළිකා තත්වයන් හටගන්නා නිසාය. අවුරුද්දකදී මෙවැනි පූර්ව මුඛ පිළිකා 6000 පමණ වාර්තා වේ. පූර්ව මුඛ පිළිකා මුල් අවස්ථාවන්හි හඳුනාගෙන අවදානම් පුරුදුවලින් (බුලත් විට, දුම් රහිත දුම්කොළ / පුවක් ආශ්‍රිත නිෂ්පාදන, දුම් පානය, මත් වතුර භාවිතය) ක්ෂණිකව ඉවත්වී ක්‍රමානුකූලව පසු විපරම් සායනවලට සහභාගී වූයේනම් ඒවා බහුතරයක් මුඛ පිළිකා බවට පත් වීම වලක්වාගත හැකිය. පූර්ව මුඛ පිළිකා වේදනාවෙන් තොර නිසාත් එදිනෙදා ජීවිතයට අවහිර නොකරන නිසාත් ජනතාව මේ සම්බන්ධයෙන් වෛද්‍ය / දන්ත වෛද්‍ය උපදෙස් පැතීමටත් ප්‍රතිකාර කටයුතු වල දිගටම යෙදී සිටීමටත් මැලිවෙයි. මේ හේතුවෙන් 60% මුඛ පිළිකා වෛද්‍ය සේවාවන් වෙත වාර්තාවන්නේ පසු අවධිවලදීය (III සහ IV අවධිවල). මෙම අවස්ථාවලදී වාර්තාවන මුඛ පිළිකා සුවවීමට ඇති ඉඩකඩ ඉතා අඩුය.

පූර්ව මුඛ පිළිකා නියත වශයෙන් හඳුනාගැනීමට සායනික මුඛ පරීක්ෂාවක් සිදු කළ යුතුය. මෙය ළඟම ඇති දන්ත සායනයෙන් හෝ සුව දිවි මධ්‍යස්ථානයෙන් සිදු කර ගත හැකිය. පූර්ව මුඛ පිළිකා හඳුනාගැනීමෙන් පසුව වැඩි දුර ප්‍රතිකාර සඳහා මුඛ හනුක වක්ත්‍ර ශල්‍ය ඒකක (Oral Maxillo-Facial Units) වෙත යොමු කරනු ලැබේ.

එමනිසා මෙම වර්ෂයේ 2023 ජුලි 27 දින සමරන ලෝක හිස සහ ගෙල ආශ්‍රිත පිළිකා දිනයේ තේමාව ලෙස **"සායනික මුඛ පරීක්ෂාවෙන් සුවැති මුවක්"** යන්න තෝරාගෙන ඇත. පහත සඳහන් ආකාරයට වැඩසටහන් ක්‍රියාත්මක කරන ලෙස ජාතික පිළිකා මර්දන වැඩසටහන සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, ප්‍රදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් සහ වෙනත් ආයතන ප්‍රධානීන් වෙත දන්වා සිටී:

1. මහජනතාව සහ අවදානම් කණ්ඩායම් (රියදුරන්, ගොවියන්, පතල්කරුවන් ආදිය) සායනික මුඛ පරීක්ෂාවේ වැදගත්කම සහ අවදානම් ලක්ෂණ පිළිබඳ දැනුවත් කිරීම.
2. පූර්ව මුඛ පිළිකා කලින් හඳුනාගැනීම සම්බන්ධයෙන් දන්ත වෛද්‍යවරු සහ වෛද්‍යවරු සඳහා දිස්ත්‍රික් මට්ටමින් ප්‍රායෝගික සවිබල ගැන්වීමේ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.
3. සුව දිවි මධ්‍යස්ථාන සහ දන්ත සායන වල සිදු කරන මුඛ පිළිකා කලින් හඳුනාගැනීමේ කටයුතු ශක්තිමත් කිරීම.

385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10, 385, வணக்கத்துக்குரிய பத்தேகம விமலவங்ச தேரோ மாவத்தை, கொழும்பு 10.
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10, Sri Lanka.

4. දිස්ත්‍රික්ක මට්ටමෙන් හඳුනාගත් අවදානම් කණ්ඩායම් සඳහා සක්‍රිය මුඛ පිළිකා කලින් හඳුනාගැනීමේ වැඩසටහන් සංවිධානය කිරීම.

මේ සඳහා අවශ්‍ය පෝස්ටර්, video පට, පුහුණු අත්පොත් සහ flash card පත්‍ර වැනි ආධාරක මෙවලම් ජාතික පිළිකා මර්දන වැඩසටහනේ නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

හිස සහ ගෙල ආශ්‍රිත පිළිකා දිනය සම්බන්ධයෙන් ඔබ ප්‍රදේශයේ / ආයතනයේ පවත්වන ලද ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාවක් පිළිකා මර්දන වැඩසටහනෙහි අධ්‍යක්ෂ වෙත 2023 දෙසැම්බර් මස 15 දින හෝ ඊට පෙර ලබා දෙන ලෙස ද දන්වා සිටිමි. මුඛ පිළිකා අවම කරගැනීමේ ජාතික කර්තව්‍ය සාර්ථක කර ගැනීම උදෙසා ඔබගේ නායකත්වය, උපදෙස් සහ සක්‍රිය දායකත්වය විශේෂයෙන් අගය කරමි.

වැඩිදුර පැහැදිලි කිරීමක් අවශ්‍ය නම් කරුණාකර අධ්‍යක්ෂ, ජාතික පිළිකා මර්දන වැඩසටහන හෝ මුඛ පිළිකා නිවාරණය හා වැළැක්වීමේ අංශය අමතන්න (දුරකථන අංක: 0112368627).

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත්:

සියලුම පළාත් සෞඛ්‍ය ඇමතිවරුන්
සියලුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්
සියලුම නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්
අධ්‍යක්ෂ, ජාතික පිළිකා මර්දන වැඩසටහන
අධ්‍යක්ෂ, බෝ නොවන රෝග
අධ්‍යක්ෂ, දන්ත සේවා
අධ්‍යක්ෂ, ප්‍රාථමික සේවා
අධ්‍යක්ෂ, පවුල් සෞඛ්‍ය කාර්යාංශය
අධ්‍යක්ෂ, සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය
පළාත් ප්‍රජා වෛද්‍ය විශේෂඥවරුන්, විශේෂඥ පළාත් ප්‍රජා දන්ත වෛද්‍යවරුන්
සියලුම වෛද්‍ය නිලධාරී (පාසල් සෞඛ්‍ය)
සියලුම ප්‍රදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරුන්
සියළුම වෛද්‍ය නිලධාරී (බෝ නොවන රෝග)
සියළුම වෛද්‍ය නිලධාරී (මාතෘ හා ළමා සෞඛ්‍ය)
සියළුම වෛද්‍ය නිලධාරී (සැලසුම්)